# කලාසූරි සොයිලියස් මැන්දිස් ජන්ම සංවත්සර
# රචනා තරගය සඳහා නිර්මාණ භාර ගැනේ

සිංහලයේ, බිතු සිතුවම් කලාවට අමිල සේවාවක් කළ කලාසූරි වලිමුනි සොයිලියස් මැන්දිස්ගේ 125 වැනි ජන්ම සංවත්සරය මේ වසරේ ජුනි 17 වැනි දිනට යෙදී ඇත.

ශ්‍රී ලාංකේය බිතු සිතුවම් කලාව ප්‍රකටම පැවැතියේ අනුරාධපුර, පොළොන්නරුව අවධිවලදීය. ඉන් අනතුරුව දක්නට ලැබුණු බිතු සිතුවම් කලා නිර්මාණ අතුරෙන් වඩාත් ජීව ගුණය පිළිබිඹු කෙරෙන බිතු සිතුවම් දක්නට ලැබෙන්නේ සොයිලියස් මැන්දිස්ගේ තෙලි තුඩින් නිමාවුණු කැලණි අලුත් විහාරයේ සිතුවම් නිර්මාණවලිනි. මෙසේ සිංහලයේ බිතු සිතුවම් කලාවේ අනන්‍යතාව හා ජීව ගුණය රැක ගැනීමට දිවි හිමියෙන් කටයුතු කළ මෙම උදාර චිත්‍ර ශිල්පියාගේ 125 වැනි ජන්ම සංවත්සරය නිමිති කරගෙන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් දීප ව්‍යාප්ත රචනා තරගයක් පැවැත්වීමට තීරණය කර ඇත.

රචනා මාතෘකා දෙකකි.

1. විසි වැනි සියවසේ ශ්‍රී ලාංකේය විහාර සිතුවම් කලාව
2. චිත්‍ර ශිල්පියකු වශයෙන් සොයිලියස් මැන්දිස්ගේ අනන්‍යතාව

කැමති මාතෘකාවක් තෝරා රචනාව ඉදිරිපත් කළ හැකියි.

මේ තරගය පාසල් හා විවෘත වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. පාසල් තරගයේ වාක්‍ය රචනා වචන 750 කට නොඅඩු විය යුතු අතර ඒවා විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පතිතුමාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු වේ. විවෘත රචනා තරගය සඳහා වයස් භේදයක් නැත. එම රචනා වචන 1000 කට නොඅඩු විය යුතුවේ. ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග හා සහතික පත් පිරිනැමේ. රචනා සමඟ පහත තොරතුරු ඇතුළත් කළ යුතුය. නම, ලිපිනය, උපන් දිනය හා වයස, දුරකථනය, තරග අංශය (පාසල්/විවෘත)

සියලුම රචනා 2022 මැයි 30 වැනි දින හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුවේ.

ගරු සභාපති, සොයිලියස් මැන්දිස් 125 වැනි ජන්ම සංවත්සර කමිටුව, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

වැඩි විස්තර සඳහා 071-4894925 දුකරථනය හෝ www.acbc.lk වෙබ් අඩවිය හෝ acbc380@gmail.com විද්‍යුත් තැපෑල සම්බන්ධ කර ගත හැකි බව ජාතික අධ්‍යාපන මණ්ඩල ගරු සභාපති මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා පවසයි.